මගේ අංකය: JSC/SEC/CIR – L/2024

අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක: **22/2024**

**සියලුම අධිකරණ නිලධාරීන් වෙත,**

<u>විෂ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කළ හැකි සංඛ්‍යාව දැනුම් දීම</u>

ශීර්ෂගත කාරණය හා සබැඳි පුනරුත්ථාපන කාර්යාංශයේ අධ්‍යක්ෂ (පුනරුත්ථාපන/පපුප්‍රශා) බ්‍රිගේඩියර් ඩී.සී.සී.ඩී.ආර්.වෛද්‍යාසේකර ආර්.එස්.පී. මහතා විසින් අධිකරණ සේවා කොමිෂන් සභාවටද පිටපතක් සහිතව අධිකරණ අමාත්‍යාංශය වෙත යොමු කරන ලද 2024.08.05 දිනැති ලිපියක් පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව එම ලිපිය අවශ්‍ය කටයුතු සඳහා අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ වෙබ් අඩවියේ පල කොට ඔබගේ අවධානයට ලක් කරන ලෙසට මට නියම කර ඇත.

02. ඒ අනුව එම ලිපිය මේ සමඟ අධිකරණ සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පල කොට ඔබගේ අවධානයට ලක් කරමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච් .එස්. සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2024 ඔක්තෝබර් මස 29 වෙනි දින
කොළඹ 12
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දීය.

M-03

ANNEXE A-


පුනරුත්ථාපන කාර්යාංශය
புனர்வாழ்வுப் பணியகம்
BUREAU OF REHABILITATION
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
நீதி, சிறைச்சாலை அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சு
MINISTRY OF JUSTICE, PRISON AFFAIRS AND CONSTITUTIONAL REFORMS

අංක: 462/2, කඩුවෙල පාර, ගනහේන, බත්තරමුල්ල.
இல: 462/2, கடுவெல வீதி, கனஹேன, பத்தரமுல்ல.
No: 462/2 ,Kaduwela Road , Ganahena , Battaramulla.


මගේ අංකය / எனது இல / My No: පුනකා/ප්‍ර/01/01/2024 ( 75 )
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2024.08.05

ලේකම්,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.
ගරු ලේකම් තුමණි,

**විෂ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කළ හැකි සංඛ්‍යාව දැනුම් දීම.**

යොමුව:
අ. අංක JSC/SEC/CIR- L/2022 හා 12/2012 දරණ 2022.09.20 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපිය.

1. මෙම කාර්යාංශය යටතේ පාලනය වන පුනරුත්ථාපන මධ්‍යස්ථාන තුනෙහි දළ වශයෙන් පුනරුත්ථාපනලාභීන් 1120 ක පමණ ප්‍රමාණයක් එකවර පුනරුත්ථාපනය සඳහා යොමු කළ හැකි අතර, දැනට පුනරුත්ථාපනය වනු ලබන පුනරුත්ථාපනලාභීන් සංඛ්‍යාව සහ තවදුරටත් එම මධ්‍යස්ථානයන් වෙත ඇතුළත් කර ගත හැකි පුනරුත්ථාපනලාභීන් සංඛ්‍යාව පහත සඳහන් පරිදි බැව් දන්වා සිටිමි.

| මධ්‍යස්ථානය | පුනරුත්ථාපනය කළ හැකි පුනරුත්ථාපනලාභීන් ප්‍රමාණය | දැනට සිටින පුනරුත්ථාපනලාභීන් ප්‍රමාණය | තවදුරටත් ඇතුළත් කර ගත හැකි පුනරුත්ථාපනාලභීන් ප්‍රමාණය |
|---|---|---|---|
| ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - කන්දකාඩු | 500 | 106 | **394** |
| තෘතියික හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය - සේනපුර | 500 | 132 | **368** |
| ඒකාබද්ධතා මධ්‍යස්ථානය - වව්නියාව | 120 | 48 | **72** |
| **එකතුව** | **1120** | **286** | **834** |

2. තවද පුනරුත්ථාපන ක්‍රියාවලිය මාස 06 ක කාල සීමාවක් තුළ සිදු කරනු ලබන බැවින් සහ පුනරුත්ථාපනලාභීන් වරින්වර පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත ඇතුළත් වන ආකාරය අනුව අදාළ කාල සීමාව අවසානයේ සමාජගත කරනු ලබන පුනරුත්ථාපනලාභීන් ප්‍රමාණයන් අනුව අඛණ්ඩව පුනරුත්ථාපන සඳහා යොමු කිරීමේ හැකියාවක් පවතී.

4. ඒ අනුව යොමුගත චක්‍රලේඛයෙහි දක්වා ඇති නිර්ණායකයන්ට අනුකූලව පුනරුත්ථාපනලාභීන් පුනරුත්ථාපනය කිරීමේ හැකියාවක් පවතින අතර ඔබ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක අදාළ ආයතන දැනුවත් කර විෂ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමට අවැසි ඉදිරි කටයුතු සිදු කරන මෙන් ඉල්ලා සිටිමි. තවද මේ පිළිබඳව සෑම සඳුදා දිනකම ඔබ වෙත ලිඛිතවද සෑම සතියේ දිනකම විද්‍යුත් තැපැල මගින්ද දන්වා එවන බැව් කාරුණිකව දන්වා සිටිමි.

**ඩී සී සී ඩී ආර් වෛද්‍යසේකර ආර්එස්පී**
බ්‍රිගේඩියර්
අධ්‍යක්ෂ (පුනරුත්ථාපන/පපුප්‍රශා)
පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් වෙනුවට

පිටපත් :
1. ලේකම් - මහජන ආරක්ෂක අමාත්‍යාංශය
2. අධිකරණ සේවා කොමිෂන් සභාව - සියලුම මහේස්ත්‍රාත්වරුන් දැනුවත් කිරීම සඳහා
3. සභාපති - විෂ මත්ද්‍රව්‍ය හා අන්තරායකර ඖෂධ භාවිතය වළක්වාලීම සඳහා කාර්ය සාධක බලකාය.
4. පොලිස්පති - පොලිස් මූලස්ථානය
5. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් - බන්ධනාගාර මූලස්ථානය
6. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය - බස්නාහිර පළාත


පොදු / பொது / General: +9411 2577457, +9411 2883891
ෆැක්ස් / தொலைநகல் / Fax: +9411 2883737, +9411 2883899
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail: bcg.rehabilitation@gmail.com
වි වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.bcgr.gov.lk